


# පළමු සැසිය

## සහන සත්කාර සේවය යනු කුමක්දැයි හදුනා ගනිමු

# සහන සත්කාර සේවය යනු කුමක්ද?

- ජීවිතයට තර්ජනයක් වීමේ අවධානමක් ඇති රෝගවලින් පීඩා විඳින රෝගීන් සහ පවුලේ සාමාජිකයන් මුහුණ දෙන වේදනාව සහ අනෙකුත් කායික, මානසික, සාමාජයීය සහ ආධ්‍යාත්මික ගැටළු කලින් හඳුනාගැනීම, පරිපූර්ණ නිවැරදි ඇගයීම සහ ප්‍රතිකාර මඟින් ඔවුන්ගේ ජීවිතවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා වන ප්‍රවේශයකි.

(ලෝක සෞඛ්‍ය සංවිධානය).

ශ්‍රී ලංකාව තුල සහන සත්කාර සේවයේ අවශ්‍යතාවය පිළිකාව වැනි බෝ නොවන රෝගවල ව්‍යාප්තියත් සමඟ මෙන්ම වියපත් ජනගහනයේ වැඩිවීමත් සමඟ වැඩිවේ.

# සහන සත්කාර සේවයේ අරමුණු කවරේද?

- රෝගියාගේ වේදනාව ඇතුළු අනෙකුත් රෝග ලක්ෂණ වලට සහනය ලබාදීම.
- ජීවිතය දෙස බලාපොරොත්තු සහගත ලෙස බැලීමට සහ මරණය සාමාන්‍ය සිදුවීමක් ලෙස අත්දැකීමට රෝගියාට උපකාර කිරීම.
- සහන සත්කාරය මගින් රෝගියාගේ මරණය කලින් සිදුවීමක් හෝ ප්‍රමාද වීමක් සිදුනොවන බව රෝගියාට ඒත්තු ගැන්වීම.
- රෝගී සත්කාරයේදී රෝගියාගේ මානසික සහ ආධ්‍යාත්මික සෞඛ්‍යය පිළිබඳව ද සැලකිලිමත්වීම.
- රෝගියාගේ මරණය දක්වා ක්‍රියාශීලීව ජීවත්වීමට අවශ්‍ය සත්කාරක සේවා ලබාදීම.

# සහන සත්කාර සේවය අවශ්‍ය වන්නේ කාහටද?

ජීවිතයට තර්ජනයක් වීමේ අවදානමක් ඇති රෝගයකින් පීඩා විඳින

රෝගීන් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් හට

සහන සත්කාර සේවය සැපයීම අවශ්‍ය වේ.

# සහන සත්කාර සේවාව අවශ්‍යවන රෝගාබාධ

## වැඩිහිටියන්ට ඇතිවියහැකි රෝගාබාධ

1. හෘදය සහ රුධිර සංසරණ පද්ධතිය ආශ්‍රිත රෝගාබාධ
2. පිළිකාව
3. නිධන්ගත ශ්වසන රෝග
4. ඒඩ්ස්
5. දියවැඩියාව
6. නිධන්ගත වකුගඩු රෝග
7. නිධන්ගත අක්මා රෝග
8. ඩිමෙන්ෂියාව
9. නිධන්ගත ස්නායු රෝග
10. උපතින්ම ඇතිවන විකෘතිතාවයන්
11. ඖෂධ ප්‍රතිරෝධී ක්ෂය රෝගය

# දරුවන්ට ඇතිවිය හැකි රෝගාබාධ

- උපතින්ම ඇතිවන විකෘතිතාවයන්
- ප්‍රෝටීන ඌනතාවය
- සංකූලතා සහිත මෙනින්ජයිටිස් රෝගී තත්ත්වය
- HIV/ඒඩ්ස්
- හෘදය සහ රුධිර සංසරණ පද්ධතිය ආශ්‍රිත රෝගාබාධ
- ප්‍රතිශක්තිකරණ ආබාධ
- ස්නායු ආබාධ
- වකුගඩු රෝග
- අක්මා සිරෝසියාව

## සහන සත්කාර සේවය ලබාදීමේදී ඇතිවන අවහිරතා

- සහන සත්කාර සේවය පිළිබඳව ඇති වැරදි මත

## පහත කරුණු පිළිබඳව හොඳින් තේරුම් ගත යුතුයි

- සහන සත්කාර සේවය මරණාසන්න රෝගීන් සඳහා පමණක් ලබාදෙන සත්කාරයක් නොවේ.
- එය ජීවිතයට තර්ජනයක් වියහැකි රෝගාබාධ වලින් පෙළෙන රෝගීන් සඳහා එම රෝගය හදුනාගත් මොහොතේ සිටම ලබාදෙන සත්කාරයකි.
- සහන සත්කාර සේවය රෝගය නිසා ඇතිවන විඳවීම් අවම කරනවා පමණක් නොව රෝගියාට ඇතිවියහැකි විඳවීම් අනුමාන කර ඒවා ඇතිවීම වළක්වයි.

## සහන සත්කාර සේවය තුලින් රෝගියා සහ එම පවුලේ සාමාජිකයන්ට සියළුම පැති ආවරණය වන පරිදි සත්කාර සේවාව ලබාදෙයි

## (Holistic Approach)

- ශාරීරික සත්කාරය
- මානසික සහ සංවේදීමය සත්කාරය
- ආධ්‍යාත්මික සත්කාරය
- සාමාජීය සහ ආර්ථික සත්කාරය

# රෝගියෙකුගේ ශාරීරික ගැටළු

- වේදනාව
- මහන්සිය සහ තෙහෙට්ටුව
- හුස්ම ගැනීමේදී ඇතිවන අවහිරතා
- කෑම අරුචිය
- ආහාර මාර්ගයේ ඇතිවන ගැටළු (මලබද්ධය, ඔක්කාරය, වමනය, පාචනය, මුඛයේ ඇතිවන වියළි ස්වභාවය)
- මානසික ව්‍යාකූලත්වය
- නිදිමත ගතිය
- තුවාල, සමේ ඇතිවන දද, කුෂ්ඨ
- අධික ලෙස දහඩිය දැමීම
- නින්ද නොයෑමේ ගැටළු

# රෝගියෙකුගේ මානසික, සංවේදීමය සහ ආධ්‍යාත්මික අවශ්‍යතා

1. මානසික පීඩාව (Psychological distress)
2. රෝගියාගේ ජීවිතය සහ ජීවත්වීම සහ සම්බන්ධව ඇති ගැටළු (Existential distress)
3. කාංසාව (Anxiety)
4. මානසික අවපීඩනය (Depression)
5. රෝගියාගේ පවුලේ සාමාජිකයන්ගේ සහ රැකබලාගන්නාගේ ඇතිවන විඳවීම්
6. රෝගියා මියගිය පසු වියෝදුක තුනීකර ගැනීම සඳහා පවුලේ සාමාජිකයන්ට සහ රැකබලාගන්නාට ලබාදෙන සත්කාරය

# සහන සත්කාර සේවා ලබාදෙන ආයතන

- රෝහල - නේවාසික සහ බාහිර රෝගීන් ලෙස
- ගිලාන ගිමන්හල් (Hospice)
- නිවස

# රෝහල තුළදී සහන සත්කාර සේවා ලබාදෙන කණ්ඩායම

- විශේෂඥ වෛද්‍යවරුන් (පිළිකා රෝග, කායික රෝග, මානසික රෝග සහ සහන සත්කාර සේවාව පිළිබඳ)
- වෛද්‍ය නිලධාරීන්
- හෙද නිලධාරීන්
- මානසික උපදේශකවරුන්
- භෞත චිකිත්සකවරුන්
- පෝෂණවේදීන්
- ඖෂධවේදීන්
- අනෙකුත් නිලධාරීන් (උදා: සමාජ සේවා නිලධාරීන්)

# සහන සත්කාර සේවා සපයන රාජ්‍ය ආයතන

- දැනට ශ්‍රී ලංකාවෙහි ඇති රජයේ ශික්ෂණ රෝහල් සහ දිස්ත්‍රික් මූලික රෝහල් බොහෝමයක විශේෂඥ සහන සත්කාර සේවා සායන ක්‍රියාත්මක වෙයි.
- ඉදිරියේදී සියළුම ශික්ෂණ රෝහල් සහ දිස්ත්‍රික් මූලික රෝහල් දක්වා මෙම සේවාවන් ව්‍යාප්ත කිරීමට කටයුතු යොදා ඇත.
- කරාපිටිය ශික්ෂණ රෝහලෙහි පිහිටුවා ඇති සහන සත්කාර මධ්‍යස්ථානය මඟින් සහන සත්කාර සේවය අවශ්‍යවන රෝගීන් සඳහා නොමිලේ නේවාසිකව සත්කාරය ලබාදෙයි.
- එය දැනට රජයේ රෝහලක ක්‍රියාත්මක වන එකම නේවාසික පහසුකම් සපයන සහන සත්කාර මධ්‍යස්ථානයයි.

# සහන සත්කාර සේවය ලබාදීම සඳහා ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය හෙද නිලධාරීන්ගේ දායකත්වය

- සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් ප්‍රාථමික ප්‍රතිකාර මධ්‍යස්ථාන වලට අනුයුක්ත කර පත්කොට ඇති මහජන සෞඛ්‍ය හෙද නිලධාරීන් හරහා රෝගීන්ට ප්‍රජාව සහ නිවෙස තුලදීම සහන සත්කාර සේවය ඇතුළු වෙනත් සේවාවන් ලබාදීම සිදු කෙරෙයි.

## ගිලන ගිමන්හල්වල (Hospice) සහන සත්කාර සේවා

- ගිලන ගිමන්හල් යනු සහන සත්කාරය අවශ්‍ය රෝගීන් සඳහා උපකාරක සේවා සැපයීම සඳහාම වෙන් කෙරුණු ස්ථානයකි.
- රෝගීන් නිට්ටාවටම සුවපත් කිරීම වෙනුවට ඔවුන්ට වේදනාව සමනය කිරීම ඇතුළු අනෙකුත් රෝගලක්ෂණ වලට සහනය ලබාදීමත් ඔවුන්ගේ ජීවන තත්ත්වය පවත්වාගෙන යාමට පහසුකම් සැලසීමත් ගිලන ගිමන්හල්වල අරමුණ වේ.
- දැනට ශ්‍රී ලංකාව තුල ස්වේච්ඡා සංවිධාන මඟින් ගිලන ගිමන්හල් (Hospices) 7 ක් ක්‍රියාත්මක වෙයි. මෙහි සේවාවන් කිසිදු අයකිරීමකින් තොරව ලබාදෙනු ලැබෙයි.

| ස්වේච්ඡා ආයතනය | ගිලන ගිමන්හල (Hospice) | දුරකතන අංකය |
|---|---|---|
| ශ්‍රී ලංකා පිළිකා සංගමය | ''ශාන්ත සෙවන'' සහන සේවා ආයතනය, මහරගම. | 011- 2585879<br>011- 2840312 |
| පිළිකා සරණ සංගමය | ''පිළිකා රැකවරණ පියස'', කුරුන්දන්කුලම, අනුරාධපුරය<br>"සහන සත්කාර සේවා ආයතනය", මාතර | 025-3243077<br><br>041- 2226766 |
| සත්‍ය සායි සමාජය | සත්‍ය සායි සුවසෙවන, හංවැල්ල | 036- 2254902 |
| Cancer Aid for North and East Sri Lanka (CANE) | "කේන්" සහන සේවා ආයතනය, යාපනය | 021- 2240258 |
| Eastern Cancer Care Hospice (EASCCA) එරාවූර්, මඩකළපුව | සහන සේවා ආයතනය, එරාවූර්, මඩකළපුව | 076- 0582248 |
| සහන සත්කාර සේවා සංගමය (Palliative Care Association) | "සහන සෙවන" සහන සත්කාර සේවා ආයතනය, අඹගහපුර, මහරගම | 077- 3355187 |

# රෝගීන් වෙනුවෙන් සහන සත්කාර සේවා ලබාදෙන වෙනත් ස්වේච්ඡා ආයතන

1. ඉන්ධිරා පිළිකා භාරය (Indira Cancer Trust) 0112363211
2. පිළිකා සුවසරණ සාධු සමාජය, ගම්පහ
3. දිවිසෙත, ගම්පහ 0774143222
4. පිළිකාව දිනූවන්ගේ සහයෝගිතා ජාලය 0112841010

## සහන සත්කාර සේවය ලබාදීම සඳහා ප්‍රදේශයේ සිටින ක්ෂේත්‍ර නිලධාරීන්ගේ දායකත්වය

- ප්‍රදේශයේ සිටින සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතුමා, මහජන සෞඛ්‍ය හෙද සොයුරිය, පවුල් සෞඛ්‍ය නිලධාරිනියන් සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් ඇතුළු කණ්ඩායම රෝගීන්ට අවශ්‍ය සහන සත්කාර සේවාවන් ලබාගැනීම සඳහා අදාළ අංශ වලට යොමුකිරීම සිදු කරයි.
- ග්‍රාම නිලධාරී, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිටින සමාජ සේවා නිලධාරී ඇතුළු අනෙකුත් ක්ෂේත්‍ර නිලධාරීන් රෝගියා ඇතුළු පවුලේ සාමාජිකයන් මුහුණ දෙන සමාජ ආර්ථික ගැටළු වලට සහනයක් ලබාදීමට දායකත්වය දක්වයි.

# සහන සත්කාරය ලබාදීම කළමනාකරණයේදී සහ අන්තර්සම්බන්ධ කිරීමේදී සැලකිය යුතු කරුණු

- සහන සත්කාර සේවා ලබාදීමට භාවිතා කළහැකි සම්පත් සහ සහයෝගිතා හදුනාගැනීම සහ ඒවා භාවිතා කරමින් රෝගියාට සහන සත්කාර සේවාව ලබාදෙන ආකාරය සැලසුම් කිරීම.
- ජීවිතයේ අවසන් කාලයේදී ලබාදෙන සත්කාරය සැලසුම් කිරීම.
- රෝගියාට අවශ්‍යකරන ඖෂධ නොකඩවා ලබාගතහැකි ක්‍රම සම්පාදනය කිරීම. උදා: මෝර්ෆීන් ඖෂදය

# සහන සත්කාර සේවය ප්‍රවර්ධනය සඳහා උපායමාර්ගික ක්‍රියාරාමුව

- ශ්‍රී ලංකාවේ සහන සත්කාර සේවාවේ ඉදිරි සැලැස්ම දක්වා ඇත.

